**දැනුම් කේන්ද්‍රයෙහි පදනම ලෙස පාසැල් අධ්‍යාපන පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතියේ (ටීඑස්ඊපී)- මධ්‍යම මට්ටම - 2013**

**-------------------------------------------------------------------------------------------------------------------**

දැනුම් කේන්ද්‍රයෙහි පදනම ලෙස පාසැල් අධ්‍යාපන පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතියේ (ටීඑස්ඊපී)- මධ්‍යම මට්ටම 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී ලං ර) හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජා සං ස) අතර 2012 මැයි 18 දින එළඹි අංක 5037-එල් කේ දරන මූල්‍ය ගිවිසුමේ 2 උපලේඛනයේ 2 වගන්තියේ බී-3 ඡේදයේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ කටයුතු ජාතික මට්ටමින් අධ්‍යාපන අමාත්‍යාංශය (අධ්‍යා.අ.) මගින්ද පළාත් මට්ටමින් පළාත් සභා මගින්ද සිදුකිරීමට අපේක්ෂා කෙරේ.ජාතික මට්ටමින් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සිදු කරන කටයුතු පිළිබඳ අදහස් දැක්වීම් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාලය

**-----------------------------------------------------------------------------------------------**

ව්‍යාපෘති ඇගයීම් ලියවිල්ලට අනුව, දිවයිනේ සාමාන්‍ය අධ්‍යාපන අංශය මුහුණ දෙන අභියෝගවලට ආමන්ත්‍රණය කෙරෙන 2012 – 2016 අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව සහ වැඩසටහන (ඊඑස්ඩීඑෆ්පී) සඳහා මූල්‍ය සහාය සැපයීමට දැනුම් කේන්ද්‍රයෙහි පදනම ලෙස පාසැල් අධ්‍යාපන පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. පාසැල් අධ්‍යාපන පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතියේ මධ්‍යම මට්ටමේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයයි. ශ්‍රී ලංකාවේ දැනුම පදනම් කරගත් ආර්ථික හා සමාජයීය සංවර්ධනය සඳහා පදනමක් සැපයීම උදෙසා ප්‍රාථමික හා ද්වීතිය අධ්‍යාපනයට ප්‍රවේශය හා ගුණාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත මුළු පිරිවැය රු.මිලියන 11,000 කට සමාන විගැහි (SDR) මිලියන 64.1 ක් (එජඩො මිලියන 100) වේ. ඉන් සියයට 70 සිට 80 දක්වා අරමුදල් පළාත් අධ්‍යාපන අධිකාරීන් සඳහා වෙන් කරන ලද අතර ශේෂය අධ්‍යාපන අමාත්‍යාංශයට වෙන්කර ඇත. 2012 ඔක්තෝබර් 01 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර 2017 ජූනි 30 වන විට නිමකිරීමට නියමිතය.

## 1.3 ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව සඳහා කළමනාකරණයේ වගකීම

**---------------------------------------------------------------------------**

අධ්‍යාපන අමාත්‍යාංශය (අධ්‍යා.අ.), විභාග දෙපාර්තමේන්තුව (වි.දෙ) හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තුමේන්තුවේ විසර්ජන (අධ්‍යා.ප්‍ර.දෙ) සංග්‍රහයක් වූ මෙම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් යෝග්‍ය මුදල් රෙගුලාසි හා මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ තෝරා ගැනීම හා යොදා ගැනීමත් මෙම වගකීමට ඇතුළත් වේ.\

## 2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

---------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත.එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කල හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි. ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදී. ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලදි. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් සහ ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂණ කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු කිරීම පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය දෙනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද අධ්‍යාපන අංශයේ මධ්‍යම ආයතන තුන සඳහා වියදම්,මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම්, මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්,ද්‍රව්‍ය සහ උපකරණ අධ්‍යාපන අංශයේ මධ්‍යම ආයතන තුනෙහි අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඉ) ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව මුදල් රෙගුලාසි (මු.රෙ) 150 හා මහා භාණ්ඩාගාරයේ 2012 නොවැම්බර් 26 දිනැති අංක 227/2012 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුකූලව පිළියෙල කර තිබුණේද යන බව.

(ඊ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් අධ්‍යාපන අංශයේ මධ්‍යම ආයතන තුන විසින් පවත්වාගෙන යනු ලබන පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේ ද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(උ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව සහ

(ඌ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර තිබුණේද යන බව.

**3. මතය**

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුනු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධයෙන් 2012 අංක 23 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ ශීර්ෂ අංක 126 යටතේ 2013 වර්ෂය සඳහා වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 150 විධිවිධාන වලට සහ මහා භාණ්ඩාගාරයේ 2012 නොවැම්බර් 26 දිනැති අංක 227/2012 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කර තිබූ බව සහ ඉහත සඳහන් ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් සහ වාර්ෂික ඇස්තමේන්තු සහ අධ්‍යාපන අංශයේ මධ්‍යම ආයතන තුන විසින් පවත්වාගනු ලබන පොත් හා වාර්තා සමඟ සැසඳුණු බව,

(ආ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඇ) ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි මූල්‍ය ගිවිසුමේ දැක්වෙන අවශ්‍යතාවන්ට අනුකූලව සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව,සහ

(ඉ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වී ඇති බවත්ය.

**4. මූල්‍ය ප්‍රකාශන**

----------------

**4.1 මූල්‍ය කාර්යසාධනය**

---------------------

ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව හා ව්‍යාපෘතිය විසින් සපයන ලද තොරතුරු අනුව, ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් ලැබුණු රු.241,852,176 ක් වූ මුදල් ඇතුළත්ව සියළු ප්‍රභවයන්ගෙන් ලැබුණු අරමුදල්වලින් සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.38,336,126,328 ක වියදමක් අධ්‍යාපන අංශය

වෙනුවෙන් දරා තිබුණි. අධ්‍යාපන අමාත්‍යාංශය (අධ්‍යා.අ), විභාග දෙපාර්තමේන්තුව (වි.දෙ) සහ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව (අධ්‍යා.ප්‍ර.දෙ) විසින් 2013 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද විසර්ජන ගිණුම අනුව සියළු අරමුදල් ප්‍රභවයන්ගෙන් දරන ලද වියදම හා සමාලෝචිත වර්ෂය තුළ ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් ලැබුණු ණය මුදල්වලින් දරන ලද වියදම පිළිබඳ සාරාංශයක් පහත වගුවෙන් දැක්වේ.

| **විස්තරය** | **සමාලෝචිත වර්ෂය තුළ සියළු අරමුදල් ප්‍රභවයන්ගෙන් දරන ලද වියදම** | **සමාලෝචිත වර්ෂය තුළ ණය මුදල්වලින් දරන ලද වියදම** | **මුළු වියදම** |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| පුනරාවර්තන වියදම | | | |
| පුද්ගලික පඩිනඩි | 20,009,975,311 | - | 20,009,975,311 |
| වෙනත් | 10,683,336,542 | 93,845,626 | 10,777,182,168 |
| ප්‍රාග්ධන වියදම | 7,642,814,475 | 148,006,550 | 7,790,821,025 |
| | 38,336,126,328 | 241,852,176 | 38,577,978,504 |

## 4.2 අග්‍රිම අරමුදල් ගිණුම

ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන යනු ලැබූ අංක 5695 දරන අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් සාරාංශ කර පහත දැක්වේ.

| | **එ ජ ඩො** | **රු.** |
|---|---|---|
| ආරම්භක තැන්පතුව | නැත | නැත |
| එකතු කළා- ඌන පූර්ණයන් | 4,875,000 | 631,368,337 |
| අඩු කළා - ආපසු ගැනීම් | 4,875,000 | 626,684,325 |
| විදේශ විනිමය පාඩුව | - | 4,684,012 |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | නැත | නැත |

## 5. විගණන නිරීක්ෂණ

----------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------------

2012 ජුලි 31 දිනැති ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය හා ප්‍රදාන සඳහා සාමාන්‍ය කොන්දේසි ප්‍රකාශනයේ 4.09 වගන්තිය අනුව, ව්‍යාපෘතියට අදාළ මෙහෙයුම්, සම්පත් හා වියදම් ප්‍රමාණවත් ආකාරයකින් නිරූපනය වන ලෙස ඒකාකාරීව යොදාගත් ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කළ යුතුය.කෙසේ වුවද, අධ්‍යාපන අමාත්‍යාංශය, විභාග දෙපාර්තමේන්තුව හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් 31 දිනට සියළු අරමුදල් ප්‍රභවයන්ගෙන් අධ්‍යාපනික අංශය සඳහා දරන ලද එකතුව රු.38,336,126,328 ක්වූ මුළු වියදම නියෝජනය වන ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 5.2 අරමුදල් උපයෝජනය

-------------------------

විගණනයට ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ හා 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ අරමුදල් උපයෝජනය පහත දැක්වේ.

| වර්ෂය | අධ්‍යාපන අමාත්‍යාංශයේ වාර්ෂික ඇස්තමේන්තුවේ ණය මුදල් සඳහා වාර්ෂික වෙන් කිරීම | සමාලෝචිත වර්ෂය තුළ සපයන ලද ණය මුදල් | | වෙන් කිරීමෙන් වැය කරන ලද මුදල | උපයෝජනය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | රු. | එ.ජ.ඩො. | රු. | රු. | % |
| 2012 | 285,000,000 | 1,800,000 | 232,455,062 | 196,500,698 | 69 |
| 2013 | 265,596,947 | 4,515,000 | 626,684,325 | 241,852,176 | 91 |
| | 550,596,947 | 6,315,000 | 859,139,385 | 438,352,874 | 51 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත තොරතුරු අනුව, ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 626.68 ක මුදලක් ලැබී තිබුණද සමාලෝචිත වර්ෂය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ වාර්ෂික ඇස්තමේන්තුවේ රු.මිලියන 265.59 ක මුදලක් පමණක් වෙන් කර තිබු අතර ඉන් රු.මිලියන 241.85ක මුදලක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ වැයකර තිබුණි. එබැවින් වාර්ෂික මූල්‍ය

සැලැස්ම මඟින් ණය මුදල් උපයෝජනය පිළිබඳ අරමුණු කළ කාර්යයන් විධිමත්ව හඳුනාගෙන නොතිබූ අතර ණය මුදල් ඵලදායීව නියාමනය කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විධිමත් යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) විගණනයට ලබාගත හැකි වූ තොරතුරු අනුව, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රු.මිලියන 26 ක ණය මුදල් විභාග දෙපාර්තමේන්තුවට, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට හා ජාතික අධ්‍යාපන ආයතනයට (ජා.අ.ආ) බෙදා දී තිබුණි. කෙසේ වුවද එම අදාළ ආයතන විසින් ණය මුදල් ඵලදායීව යෙදවීමට පියවර ගෙන නොතිබුණි. 2013 දෙසැම්බර් දිනට ලැබුණු අරමුදල්, උපයෝජනය කළ මුදල් හා සමාලෝචිත වර්ෂය අවසානයට වැය නොකර පැවතුණු ශේෂය පහත දැක්වේ.

| ආයතනයේ නම | ලැබුණු අරමුදල් | උපයෝජනය කළ මුදල | වැය නොකර පැවතුණු ශේෂය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| අධ්‍යාපන අමාත්‍යාංශය | 10,000,000 | 2,904,272 | 7,095,728 |
| අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | 6,000,000 | 2,313,362 | 3,686,638 |
| ජාතික අධ්‍යාපන ආයතනය | 10,000,000 | 5,848,749 | 4,151,251 |
| එකතුව | 26,000,000 | 11,066,383 | 14,933,617 |

## 5.3 භෞතික කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදනයන් ගොඩනැඟිලි ඉදිකිරීම් වැඩ නිමකිරීමට පෙර සිදුකර තිබුණු බැවින් මහින්දෝදය වැඩසටහන යටතේ පාසැල් 17 ක ඉදිකරන ලද රසායනාගාරවල භාවිතය සඳහා රු.මිලියන 10.29 ක පිරිවැයකට ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කර තිබුණු ලී බඩු හා උපකරණ නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවතුණු බැවින් ව්‍යාපෘති කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු නිලධාරින් අතර විධිමත් සම්බන්ධීකරණයක් නොතිබූ බව පහත විස්තර කෙරෙන අවස්ථාවලින් නිරීක්ෂණය වේ.

(i) රසායනාගාර ගොඩනැඟිල්ලේ ඉදිකිරීම් වැඩ ආරම්භ කර නොතිබුණද රු.605,216 ක් වටිනා ලී බඩු හා උපකරණ තංගල්ල කාන්තා විද්‍යාලයට සපයා තිබුණි.

(ii) වීරකැටිය රාජපක්ෂ ජාතික පාසලට, මොණරාගල මහානාම මධ්‍ය මහා විද්‍යාලයට හා ගාල්ල මල්හාර් සුල්හියා මධ්‍ය මහා විද්‍යාලයට රු.මිලියන 2.42 ක් වටිනා ලී බඩු හා උපකරණ සපයා තිබුණද එම පාසැල්වල රසායනාගාර ගොඩනැඟිලිවල ඉදිකිරීම් වැඩ පිළිබඳ ප්‍රගතිය 2014 පෙබරවාරි 28 දිනට සියයට 60 ට වඩා අඩු වී තිබුණි.

(ආ) තවද, අදාළ පාසැල්වලට රු.මිලියන 16.23 ක් වටිනා ලී බඩු හා උපකරණ එකඟ වූ පරිදි සැපයීමට අවස්ථා 107 කදී කොන්ත්‍රාත්කරුවන් අපොහොසත් වූ බව විගණනයේ දී නිරීක්ෂණය විය. කෙසේ වුවද කොන්ත්‍රාත්තුවේ කාලය දීර්ඝ කිරීමට හෝ අවසන් කිරීමට හෝ අදාළ කොන්ත්‍රාත්කරුවන් සමඟ එළඹී ගිවිසුම් සංශෝධනය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඇ) මහින්දෝදය වැඩසටහන යටතේ පාසැල් 12 ක රසායනාගාර ගොඩනැඟිලි ඉදිකිරීම 2013 දෙසැම්බර් 31 දිනට සියයට 24 සිට සියයට 53 දක්වා වූ මන්දගාමී ප්‍රගතියක් දක්වා තිබුණි. කෙසේ වුවද අදාළ ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පවරාගැනීම මත පැනනැඟි ගැටළු හේතුවෙන් තංගල්ල කාන්තා විද්‍යාලයේ රසායනාගාර ගොඩනැඟිල්ල ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඈ) විගණනයට ලබා ගත හැකි වූ තොරතුරු අනුව,පාසැල් පදනම් අධ්‍යයන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සඳහා තෝරාගත් ජාතික පාසැල් 50 ක් හා ද්වීතිය මට්ටමේ පළාත් පාසැල් 359 ක් සඳහා රු.මිලියන 162.5 ක් වූ ප්‍රදාන 2012 වර්ෂයේ දී සිදුකර තිබුණි.මේ සම්බන්ධයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛ අනුව, දෙවන අදියර සඳහා අරමුදල් මුදා හැරීමට පෙර පළමු අදියරේ ප්‍රගතිය සමාලෝචනය කළ යුතු විය.

මේ සම්බන්ධයෙන් තවදුරටත් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් හා පාසැල් විදුහල්පතිවරුන් මඟින් පළමු අදියර යටතේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා පියවර ගැනීමෙන් තොරව 2013 වර්ෂයේ දී මෙම වැඩසටහනේ දෙවන අදියර යටතේ රු.මිලියන 89.5 ක්වූ අරමුදල් ජාතික පාසැල් 132 කට හා ද්වීතිය මට්ටමේ පළාත් පාසැල් 466 කට මුදාහැර තිබුණි.

(ii) චක්‍රලේඛ උපදෙස් පරිදි ද්වීතිය මට්ටමේ පාසැල් සඳහා පාසැල් පදනම් අධ්‍යයන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දි ව්‍යාපෘති යෝජනා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලබා ගැනීමට අවශ්‍ය කර තිබුණි. කෙසේ වුවද එවැනි යෝජනා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගෙන් ලබාගෙන නොතිබුණි.

(iii) 2013 වර්ෂයේදී වැඩසටහනේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 15.70 ක්වූ වෙන්කිරීමක් කර තිබූ නමුත්, සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 16.41 ක මුදලක් වැය කර තිබුණි.

(ඉ) අධ්‍යාපන අමාත්‍යාංශයේ මාධ්‍ය ඒකකය සඳහා රු.180,000 පිරිවැයකට සමාලෝචිත වර්ෂයේ මාස තුනක කාලයක් සඳහා තාක්ෂණික සහකාරවරයකුගේ (TA) සේවය ලබාගෙන තිබුණි. යොමුගත කොන්දේසි වල සඳහන් අරමුණු ඉටුකර ගැනීමට තාක්ෂණික සහකාර විසින් යෝජනා ඉදිරිපත් කර තිබුණද එම යෝජනා ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන නොතිබුණි.